චක්‍ර ලේඛ අංක :- 39...../2013

මගේ අංක :- ඩබ්/03/පසුභාර/2013,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2013.10.23

සියළුම බන්ධනාගාර අධිකාරීන්/ සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

## සිරකරුවන්ගේ පවුල් සුභසාධනය සහිත පසුභාරකාරීත්ව වැඩසටහන

සිරකරුවන්ගේ පවුල් සුභසාධන වැඩසටහනට අදාලව මගේ අංක :- ඩබ්/පසු/2011 හා 2011.03.08 දිනැතිව නිකුත් කර ඇති අංක: 06/2011 චක්‍රලේඛයට අමතරවයි.

02. පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සහ අප දෙපාර්තමේන්තුව එක්ව සිරකරුවන්ගේ පුනරුත්ථාපන හා සුභසාධන කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා දැනටමත් පියවරයන් රැසක් යොදා ඇත. එකී කාර්යයේදී ඔවුන්ගේ පවුල් වල සුභසාධනය සහ ඔවුන් නිදහස්වීමෙන් පසුව ඔවුන්ගේ පසුභාරකාරීත්වය පිළිබඳවද වැඩි අවධානයක් යොමු කිරීමේ වැදගත්කම පෙනිගිය හෙයින් දිවයිනේ සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල සම්බන්ධ කරගනිමින් සම්බන්ධීකරන ජාලයක් ආරම්භ කර ඇත. එම වැඩ පිළිවෙල සාර්ථක කරගැනීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට අඛණ්ඩව සිරකරුවන්ගේ පවුල් වල තොරතුරු සහ ඔවුන් නිදහස් වීමෙන් අනතුරුව ඔවුන්ගේ පසුභාරකාරීත්වයට අදාල තොරතුරු සැපයිය යුතුව ඇත.

03. එබැවින් මින් ඉදිරියට පහත සඳහන් උපදෙස් පරිදි කටයුතු කරන ලෙසට දන්වමි.

I. අවුරුදු 02 ට වැඩි සිරදඬුවම් ලබා බන්ධනාගාර ගතවන සෑම සිරකරුවෙක්/සිරකාරියක්ම මෙම වැඩ සටහනට සම්බන්ධ කරගත යුතුය. විශේෂ හේතූන් මත ඊට අඩු සිරදඬුවම් ලබා ඇති අයවලුන් ද සම්බන්ධ කල හැකිය.

II. මෙම සෑම සිරකරුවෙක්ම/සිරකාරියක්ම සම්බන්යෙන් බන්ධනාගාර ගතවූ විගස පුනරුත්ථාපන නිළධාරීන් විසින් සිදුකෙරන ආරම්භක හැඳින්වීමේදී ඔවුන්ගේ පවුල් සුභසාධනය සඳහා යම් කාර්යභාරයක් සැලසිය යුතු වේ නම් වෙන් වෙන්ව හඳුනාගත යුතුය. (නිවැසියන්ගේ රැකවරණය, ස්වයං රැකියා අවශ්‍යතාවය, ජීවනාධාර, දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සහ වෙනත් ගැටළු) ඒ අනුව දැනටමත් බන්ධනාගාර කොමසාරිස් (සුභසාධක) වෙත පවුල් සුභසාධනය සඳහා සම්පූර්ණ කර ඊලඟ මාසයේ 07 වන දිනට ප්‍රථම එවන පෝරමය තවත් පිටපතක් සහිතව සකස්කර එකී පිටපත සිරකරුවන්ගේ ගම් ප්‍රදේශයට අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත යැවීමටද මින් ඉදිරියට කටයුතු කල යුතුය.

III. එසේම බන්ධනාගාර පුනරුත්ථාපන වැඩසටහනට සම්බන්ධවී හැසිරීම් රටාවන්ගේ යහපත් වර්ධනයක් ඇති කරගෙන සමාජගතවන සිරකරුවාට අවශ්‍ය සහයෝගය සැලසීම සඳහාත් සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල ඉදිරිපත්ව ඇත. එබැවින් එකී අවශ්‍යතාවයන් පවතින සිරකරුවන්/සිරකාරියන් හඳුනාගෙන ඔවුන් නිදහස්වීමට මාස 03 කට පෙර මේ සමග එවන පෝරමයද ඉහතින් උපදෙස් දී ඇති පරිදි බන්ධනාගාර කොමසාරිස් (සුභසාධක) වෙත එවිය යුතු අතර එහි පිටපතක් ද අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත යැවීමටද කටයුතු කලයුතුය. (ආකෘති පත්‍රය අමුණා එවා ඇත.)

04. මෙකී කාර්යයන්හි සාර්ථකත්වය පුනරුත්ථාපන නිළධාරීන්ගේ උනන්දුව සහ වගකීමෙන් කටයුතු කිරීම මත තීරණය වන බැවින් ඒ සම්බන්ධව ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන ලෙසටද දන්වමි.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

# සිරකරුවන් සඳහා පසුභාරකාරීත්ව ව්‍යාපෘතිය

## අයදුම් පත්‍රය

1. සිරකරුට අදාල පුද්ගලික තොරතුරු

I. සම්පූර්ණ නම :- ..........................................................

II. ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................................

III. ස්ථිර ලිපිනය :- ..........................................................

..........................................................

IV. විශේෂ තොරතුරු :-

| වයස | ස්ත්‍රී/පුරුෂ | වාර්ගිකත්වය | ආගම | අධ්‍යාපනය | විවාහක/අවිවාහක |
|---|---|---|---|---|---|
| | | | | | |

V. මාසික ආදායම :-

| රැකියාව | සහනාධාර | වෙනත් |
|---|---|---|
| | | |

VI. විශේෂ කුසලතා හා භාෂා හැකියාව :- ..........................................................

VII. වෘත්තීය පුහුණු :- පෙදරේරු, වඩු කර්මාන්තය, විදුලි කාර්මික, පෑස්සුම් ශිල්පය, රියදුරු බලපත්‍ර, වෙනත් විශේෂ පාඨමාලා

VIII. පදිංචි ස්ථානයට අදාල ග්‍රාම සේවා කොට්ඨාශය :- ..........................................................

IX. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය :- ..........................................................

X. අදාල පොලිස් ස්ථානය :- ..........................................................

XI. පදිංචියට ආසන්නම ආගමික ස්ථානය :- ..........................................................

XII. ස්ථිර ලිපිනයට යා හැකි කෙටි මාර්ගය :- ..........................................................

..........................................................

..........................................................

02. සිරකරුට අදාල බන්ධනාගාර තොරතුරු :-

I. සිරකරුගේ අංකය :- ..........................................................

II. බන්ධනාගාර ආයතනය :- ..........................................................

III. බන්ධනාගාර ගතවු චෝදනාව :- ..........................................................

| කප්පම් ගැනීම | මිනී මැරුම් | හොරකම් | අල්ලස් | ස්ත්‍රී දූෂණ | වෙනත් | චෝදනා රැසක් |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

IV. බන්ධනාගාර ගතවු දිනය :- ..........................................................

V. නිදහස් වන දිනය :- .................................. දඬුවම් කාලය :- ..................................

VI. වැඩ අංශය :- ..........................................................

VII. මිට පෙර බන්ධනාගාර ගතව සිටියේද? ..............................

| වාර ගණන | හේතුව |
|---|---|
| | |

VIII. වියදීමට ඇති වෙනත් හඩු තිබේද ? ..................................

IX. වෙනත් විනය චෝදනාවන්ට ලක්ව තිබේද ? ..................................

X. සිරකරුගේ සෞඛ්‍ය තත්වය :- ..............................................................................

රෝග තත්වය :- .......................................................................................................

ප්‍රතිකාර ලබා තිබේද ? ..............................................................................................

XI. බන්ධනාගාරය තුලදී.

| දුම්පානය | බුලත් හැපීම |
|---|---|
| | |

03. සිරකරුට අදාල පුනරුත්ථාපන තොරතුරු :-

I. මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩ සටහන් වලට සහභාගි වී තිබේ නම් ස්ථානය හා එහි ස්වභාවය :- ..........................................................................................

II. බන්ධනාගාරය තුල සහභාගි වූ වෙනත් ක්‍රියාකාරකම් :- ..............................................

III. බන්ධනාගාරය තුල ආගම ඇදහීම :- ............................................................................

IV. භාවනා වැඩසටහන් වලට සහභාගි වීම :- ......................................................................

V. නිදහස් වීමේදී බලපාන ගැටළු :- ..................................................................................

VI. නිදහස් වීමෙන් පසු බලාපොරොත්තු වන රැකියාව සහ ආධාර :- ..................................

.........................................................................................................................................

04. සිරකරුගේ පවුල් පසුබිම පිළිබඳ තොරතුරු :-

I. භාරකරුගේ නම :- ..................................................................................................

II. පවුල් ආශ්‍රිත තොරතුරු :-

| සාමාජිකයාගේ නම | නැදෑකම | අධ්‍යාපනය | තරාතිරම | මාසික ආදායම |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

III. නිවාසය පිළිබඳ තොරතුරු :-

| ස්ථිර | කුලී | තට්ටු | පැල්පත් | ජලය | විදුලිය | දුරකථන | වාහන |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

IV. සිරකරුගෙන් පවුලට ඇති බලපෑම කෙසේද ? :- ..........................................................

V. පවුලේ සාමාජිකයන් මේ සම්බන්ධව ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද ? ........................

.........................................................................................................................................

VI. වෙනත් විශේෂ කරුණු :- ............................................................................................

.........................................................................................................................................

..............................................................

පුනරුත්ථාපන නිළධාරීගේ නම හා අත්සන

දිනය :- ..............................

බන්ධනාගාරය :- ................................